රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2016

මගේ අංකය : MPA/IAD/ADM/GA01/චක්‍රලේඛ
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2016-10-20

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>පොලිතින්, ප්ලාස්ටික් හා විද්‍යුත් අපද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන -2016</u>**

ජනාධිපති ලේකම් කාර්යාලයේ අංක PS/DSP/ENV-U/WST-MGNT හා 2016-10-19 දිනැති ලිපිය හා බැඳේ.

02. පොලිතින්, ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික උපාංග භාවිතය දිනෙන් දින ඉහල ගොස් ඇති අතර දිනපතා භාවිතයෙන් ඉවත් කරනු ලබන පොලිතින්, ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරිම හේතුකොට ගෙන විවිධ පාරිසරික, සෞඛ්‍යමය හා ආර්ථික ගැටලු වලට මුහුණ දීමට ජනතාවට සිදු වී ඇත. මෙම ගැටලුවට විසඳුමක් ලෙස පොලිතින්, ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරිම හා විධිමත්ව බැහැර කිරිම සඳහා "පොලිතින්, ප්ලාස්ටික් හා විද්‍යුත් අපද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩ සටහන" 2016-10-24 සිට 2016-10-30 දක්වා පැවැත්වීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් සැලසුම් කර ඇත.

03. ඒ අනුව දීප ව්‍යාප්තව පැවැත්වෙන මෙම ජාතික වැඩ සටහනට සමගාමීව සියලුම රාජ්‍ය ආයතන තුල අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

- සියලු රාජ්‍ය ආයතන තුල හා ඉන් පිටත ද පොලිතින් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඇතුළුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම.
- අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම නිසිපරිදි වෙන්කර බැහැර කිරීමට කටයුතු කිරිම.
- අපද්‍රව්‍ය බහාලීම සඳහා සම්මත වර්ණ රටා සහිත කසල බඳුන් ස්ථාපනය කිරිම.
- ආයතනය තුළ පොලිතින් භාවිතය අවම කිරිම, පොලිතින් කෑම දවටන වෙනුවට පරිසර හිතකාමී ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරිම සහ ආපන ශාලාවල පොලිතින් කෑම දවටන භාවිතය නතර කිරීමට උපදෙස් දීම.
- ආයතනය තුළ ඉහත ක්‍රියාමාර්ග නිසි අධීක්ෂණයක් යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරිම.

04. පාරිසරික හා සෞඛ්‍යමය ගැටලුවලින් තොරව රාජ්‍ය ආයතන පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩසටහන් ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත් :

1. ජනාධිපති ලේකම් - ඔබගේ අංක PS/DSP/ENV-U/WST-MGNT හා 2016-10-19 දිනැති ලිපිය අනුව කරු.දැ.ගැ.ස.